n



# ජනකවියෙන් අරුත් ගැන්වෙන ගැමි දිවියේ යථාර්ථය

අතීත ජනයා තමන්ගේ කාන්සිය වෙහෙස නිවා ගැනීමටත් වේදනාව තුරන්කර ගැනීමටත් විනෝදය සඳහාත් ජනකවි යොදා ගත්හ. අධික දුක් පීඩාවන්ගෙන් වෙහෙසුන ගැමි ජනයාගේ දොම්නස් හා සොම්නස් සුසුම් ජනකවියෙන් පිළිඹිබු වෙයි. පොදු ජනයා අතර පරම්පරාවෙන් පරම්පරාවට කටින් කට පැවත එන කාව්‍ය විශේෂයකි ජනකවි. මට සිලිට බව, සරල බව හා සුන්දර බව ඒවායේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ වෙයි.

ජනකවි මගින් ගැමි ජීවිතය, ගැමි සංස්කෘතිය හා පැරන්නන්ගේ සිතුම් පැතුම් පිළිබඳ රසවත් තොරතුරු රාශියක් අනාවරණය වෙයි.

ජනකවියක ලක්ෂණ වන්නේ පරම්පරාවෙන් පරම්පරාවට කටින් කට පැවත ඒම, විශාල ප්‍රදේශයක ව්‍යාප්තව පැවතීම, , දීර්ඝ කාලයක් තුළ මිනිසුන් අතර ව්‍යවහාරයට පත්ව තිබීම හා සාමාන්‍ය ගැමි ජනතාවගේ සරල බස් වහර හා ජීවන රටාව නිරූපනය වීම වේ.

පැල් කවි, කුරක්කන් කවි, පතල් කවි, නෙළුම් කවි, පාරු කවි, කරත්ත කවි, උපදේශ කවි, දඩයම් කවි, සීපද, දරු නැළවිලි ගී, වැදි කවි, රබන් පද, වස් කවි, ඔන්චිලි වාරම් කවි, සංදේශ කවි, උපමා කවි, කවට කවි, සොකරි කවි, සෙත් ශාන්ති කවි, තේරවිලි කවි, තලමල කවි, උඩැක්කි කවි, බමර කවි හා කමත් කවි ආදී වශයෙන් වර්ග රාශියකි.

# පැල් කවි

1
පෙරකලේ තැනු පැල දැන් දිරාලා
එමකලේ බැඳපු වැට ගොනු කඩාලා
පැල්පතේ ගොයම් රෑ රැක බලාලා
නිදිමතේ කියමු පැල් කවි ගොතාලා

2
එගොඩත් බලමි එගොඩත් වවුලන්ගෙ කැලේ
මෙගොඩත් බලමි මෙගොඩත් වවුලන්ගෙ කැලේ
දෙගොඩම බලමි දෙගොඩම වවුලන්ගෙ කැලේ
වව්ලනි තොපට මොර ඉදිලා පල්ලෙ කැලේ

3
කන්දේ ගලේ වී වැපුරුවෙ මනාවයි
ඒක කන්ට කක්කුට්ටන් දෙබානයි
රන් එතනා හිස පීරන පනාවයි
බට්ටිච්චගෙ ගී ඇසුවම හිනාවයි

4
කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නලල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුද පය පාමුද වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

5
විල පාලුයි විල දමලා කොක්කු ගියා
මල පාලුයි මල දමලා බඹරු ගියා
ගහ පාලුයි පිපි මල් පරවෙලා ගියා
මට පාලුයි රංමැණිකා දීගෙ ගියා

6
උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා
බට දඬු කපන තැන බට දඬු රිකිල්ලා
වතුර වැටෙන තැන හොල්මන් කුරුල්ලා
පැල්කවි කියන්නට හපනෙක් වරෙල්ලා

7 වෙලක මහිම බල මා වී පැසීලා
පැලක මහිම බට බට කොළ සොයලා
මලක මහිම බල අතු අග පිපීලා
ලියක මහිම බල ගෝමර ඉසීලා

8 අන්දර කැලේ දර කැඩුමට යන්ට එපා
පාලු ළිඳේ දිය කෙළියේ යන්ට එපා
අනුන් කියන බස් හිතකට ගන්ට එපා
රටක ගියත් මට නොකියා යන්ට එපා

9 වෙල හොඳ මොකද යලමහ පාළුවේ නම්
පැල හොඳ මොකද පොද වැස්සට තෙමේ නම්
මල හොඳ මොකද අතු අග පරව යේ නම්
ලිය හොඳ මොකද ඉසි ගෝමර මැකේ නම්

10 කැලේ ගොසින් ඉණි කැපුවා කැත්ත දනී
වෙලේ ගොසින් වැට සැදුවා නියර දනී
පැලේ ගොසින් පැල් ලැග්ගා පැදුර දනී
මෙදා යලේ පැල් ලැග්ගා දෙවියෝ දනී

11 පැලේ පිදුර සුළඟට වැනි වැනීයේ
වැවේ වතුර රැල්ලට සිඳි සිඳීයේ
වෙලේ ගොයම පින්නට පැසි පැසීයේ
අපේ මෙවන් දුක දෙවිඳුට පෙනීයේ



# කරත්ත කවි

12 කලුගල් තලාලයි පාරට දමන්නේ
එමගල් පැගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර අදින්නේ
කිරිගල් පොත්ත කන්දයි මේ නගින්නේ

13 බතට කන්න බැරි බතලේ ගල කන්ද
අලට කන්න බැරි අලගල්ලේ කන්ද
හුනට කන්න බැරි හුන්නස්ගිරි කන්ද
මේ කඳු තුනට නායක සමනල කන්ද

14 කන්ද නගින කොට දෙවියනි බඩ දනවා
තැන්නට බහින කොට වීරිය උඩ යනවා
පල්ලන් දකින විට අතපය වෙව්ලනවා
විෂ්ණු කතරගම දෙවිවරු සිහිවෙනවා

15 තන්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා
කටුකැලේ ගාල නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පවුකළ ගොනෝ ඇදපන් හපුතල් යනවා

16 හඳපානේ නරකද මීගමු යන්න
එම පානේ නරකද වෙළඳම් ගන්න
බැරි රාලේ කරවල ගඳ උසු ලන්න
මතු වාරේ නොපතන් මීගමු යන්න

17 එගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද ගොනා
මෙගොඩ ගොඩේ නා කණුවේ බැන්ද ගොනා
දෙගොඩ තලා එන වතුරට පැන්න ගොනා
අපොයි මගේ රන්මුතු වල්ලියා ගොනා

18 සසඳ සසඳ හඳ පානේ අපි යනවා
මම්මල බඳවා ගොන් බානක් දක්කනවා
සකිය සගව්වට රෝදය කැරකෙනවා
දත් කැකුළට අපි කුරුණෑගල් යනවා

## ❒ ගොයම් කැපුමේ කවි

19 රන් දෑකැති ගෙන නිති සැරසෙන වා
රත්තරං පටි ඉණ වට දිලිසෙන වා
රිවිදුටු පිනිබිඳු ලෙස පහවෙන වා
දුම්බර කෙතේ අපි ගොයම් කපන වා

20 උදේ සිටන් වකුටු කොන්ද දිග හැර පල්ලා
අතේ තියන ගොයම් මිටිය බිම දම පල්ලා
හිසේ තියන ලේන්සු පොඩිය අතට ගනිල්ලා
සතර වරම් දෙවි පිහිටෙන් ගොඩට යමල්ලා

21 වරම් වරම් මට මහබඹු අතින් වරම්
වරම් වරම් ඉසිවර දෙවි අතින් වරම්
වරම් වරම් සක්වල දෙවි අතින් වරම්
වරම් ගොයම් කැපුමට දෙවි අතින් වරම්

22 එපා කියන තැන තැන නොසිටිල්ලා
අපහසු නම් සෙවණේ සිටපල්ලා
පිපාස නම් දියවර බීපල්ලා
කපා ගොයම් කඩිනම් කරපල්ලා

23 රැළින් රැළට යන මුවරැළ වැන්නේ
අතින් අතට ලිය දෑකැති ගන්නේ
ගොසින් රුවට කෙටි තාල කපන්නේ
ඉතින් අපට දොස් නැත දෙවියන්නේ

24 පුන්සඳ වටතරු පැයූ විලසට
පෙම්බර අඟනෝ බැසලා කුඹුරට
රන් කැති මාරුව දමමින් අහසට
නංගිලා දුර වෙනු අවුරෙන් අවුරට

25 ඉරු දෙවියන්ගේ ඉරගල ගාලා
සඳ දෙවියන්ගේ සඳගල ගාලා
ගණ දෙවියන්ගේ කෝවිල ගාලා
අපිත් කියමු ගී ගොවිපළ ගාලා

26 රිදියෙන් තනලා රත්රන් ඔබලා
කැරැළි කෙටුවයි දෑකැත්තේ
සුරතට රන්වන් රැළි නංවාලා
කදිමට දිලිසෙයි දෑකැත්තේ
අඩියෙන් අඩියට තාල තියන්නට
සබයෙන් අවසර ලැබ ගත්තේ
සතර වරම් දෙවියන්ගේ බලයෙන්
ගොයම් කපමු අපි දෑකැත්තේ

27 යකඩෙන් වානෙන් සිරිබර දීලා
සොඳට සැදෙව් මගේ දෑකැත්තේ
ඇත් දත් වලිනුත් මිටි ලියවාලා
රිදියෙන් කරවපු වැඩක් වෙතේ
රන්වන් දෑකැති සුරතට අරගෙන
රන්වන් ගොයමට ළඟා වෙතේ
අඩියෙන් අඩියට පේළි සැදීලා
ගොයම් කපමු අපි දෑකැත්තේ



## ❒ පන් නෙළුම් කවි

| | | |
|---|---|---|
| 28 | ගාන තෙල් සඳුන් වරලස ඔමරි | කොට |
| | මූණ පුරා තෙල් ගාගෙන යන | කලට |
| | මාන බලති මිනුවන් පන් තිබෙන | කොට |
| | නෑනේ නුඹත් එනවද පන් | නෙළන්නට |
| 29 | ඉසට පියුම් ලා පැදුරේ | වියඤ්ඤා |
| | පයට පියුම් ලා පැදුරේ | වියඤ්ඤා |
| | මැදට ඇඳ රටා ඇස්පත් | වියඤ්ඤා |
| | කොනට සතර මුල් අර දඟ | වියඤ්ඤා |
| 30 | ආල වඩන රුව ඇති | කදිමට |
| | ලීල ඔමරිකම් පානා සත | හට |
| | වේලා කපා බැදගති ගෙන | එන්නට |
| | රත්න ගිරෙන් යමු පන් | උදුරන්නට |
| 31 | අක්කණ්ඩියේ යමු අපි පන් | නෙළන්නට |
| | ඔක්කොම ගියා රන් මිණිවන් පන් | විලට |
| | ගොසින් පන් නෙළා එන්නේ | සවසකට |
| | කවුද නගෝ දරුවට කිරි | පොවන්නට |

## ❒ පතල් කවි

32 ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලේ බතට
බොන්නෙත් බොර දියයි පූරුවේ කළ පවට
යන්නේ කවදාද මව්පියෝ දකින්නට

33 දුම්බර කන්ද පාමුල මිණිරන් පතලේ
බැසලා බඹ තිහක් කළුගල සිදුරු කලේ
බස්නාහිරට දෝනා දෙක ගමන් කලේ
විස්තර කියම් දුම්බර මිණිරන් පතලේ

34 මිණිරන් පතල හරියට අපෙ ගෙදර වගේ
කෝකි අයියා හරියට මැණියෝ වගේ
ලියන අප්පු පවුලට ලොකු අයියා වගේ
ලෝඩර ගොල්ල හරියට යම පල්ලෝ වගේ

35 දඩිබිඩි ගගා කරනා වැඩ රට වටියේ
රට වෙඩි දමා කඩනා කළුගල් කැටියේ
මඩයට තිබෙන මිණිරන් ගන්නා සැටියේ
උඩ වැඩ කරන අයට දෙන්නේ අඩු පඩියේ

36 මිණිරන් කන්ද පාමුල ගම රා ගෙදර
එම රන් ගෙනියන්නට කැපුවා මහ පාර
වතුරෙන් සැප හොඳයි කුඹුකේ ළිඳ වතුර
ගණරන් රුවයි මිණිරන් කඳ රා ගෙදර

37 කළුවන් කළුවරයි මංගෝ දිලිසෙනවා
මිණිරන් තෝරන්න දින ගණනින් යනවා
මිණිරන් තේරුවොත් ළඳෙ නුඹ කළු වෙනවා
ළඟ නම් ගෙදර මුර ඇරුණම මම එනවා



## ❒ ඔළිඳ කෙළිය

38 ඔළිඳ තිබෙන්නේ කොයි කොයි    දේසේ
ඔළිඳ තිබෙන්නේ බංගලි    දේසේ
ගෙනත් සදන්නේ කොයි කොයි    දේසේ
ගෙනත් සදන්නේ සිංහල    දේසේ

39 ඔළිඳ වැපුරුවද බලකොයි    නෑනෝ
එක්පෙති වෙච්චද බලකොයි    නෑනෝ
දෙපති වෙච්චද බලකොයි    නෑනෝ
තුන්පෙති වෙච්චද බලකොයි    නෑනෝ

40 රැන් ඇදිච්චද බලකොයි    නෑනෝ
ගසට පලච්චද බලකොයි    නෑනෝ
මල් හට ගත්තද බලකොයි    නෑනෝ
එල හට ගත්තද බලකොයි    නෑනෝ

41 කිරිසල් වෙච්චද බලකොයි    නෑනෝ
රැන් ඇදිච්චද බලකොයි    නෑනෝ
ඔළිඳ පැහිච්චද බලකොයි    නෑනෝ
ඔළිඳ කඩන්නට යමු අපි    නෑනෝ

42 ඔළිඳ කඩන්නට මොකක්    ගෙනෙන්නේ
රත්තරණෙන් රන් කෙක්ක    ගෙනෙන්නේ
කෙක්ක කපන්නට මොකක්    ගෙනෙන්නේ
රත්තරණෙන් රන් ගිරේ    ගෙනෙන්නේ

43 කෙක්ක වෙළන්නට මොකක්    ගෙනෙන්නේ
රත්තරණෙන් රන් කෙන්ද    ගෙනෙන්නේ
ඔළිඳ දමන්නට මොකක්    ගෙනෙන්නේ
රත්තරණෙන් රන් පෙට්ටි    ගෙනෙන්නේ

44 උදා රමට වුත් එළුපිළි වැන්නේ
දදාල මැද වුණු කරමුව ඉතිනේ
මෙදා අපට ගිය අවුරුදු කෝනේ
සදා ඔළිඳ කෙළිමුව අසමානේ

45 කෙළිමු ඔළිඳ අපි දෙපිල බෙදීලා
කියමු අමුතු රස බස් අඟවාලා
බලා මදෙස දූත බැරි පිටිපාලා
පිරිමි සිටිති කිව් දෙපස බෙදීලා

46 දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්ඩ යන සැටි
බලන් කලු
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන්
කරයි කලු
දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා
බලයි කලු
දුනුකේ මල සේ උළුගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි
බලන් කලු

## ❒ රබන් කවි

47 වරලසා පිලසෙ නීල මල්දමින් ගොතා සොබන
මෙදි ගැසා සඳුන් තිලක ලමින් නළලතා
ගෙල යසා රනින් මාල කරේ පළඳිතා ලෙළෙන
ඉගයසා රනින් එපට සේල දිලිසෙතා

48 අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රැවින්
ගතපිට බැඳ සොළවා සිලි සිලි නද කරමින්
සිතකට වත් නොගෙන තවත් විදුලිය විලසින්
අහසට දමමින් අල්ලා රබාන දැතින්

49 සඳුන් කොකුන් මොරසු ගාන - මුදුන් කරල වරල බදින
රජුන් සමඟ ඇමති සිටින - ළඳුන් දුටද රජගෙට යන
උරතල කල ඕඩියලෙන්ද - කරතල සපුමල ලෙසින්ද
දුර දුර ඉසි ගෝමරින් ද - ලද නුඹ හැර වෙන කොයින්ද

50 ත්‍රිවිධ ඥාන විදුරූ - පඬි අප මහ ගෞතම නම් මුණිඳු
මේ බුදු වුණ - ගෞතම නම් මුණිඳු
එදා ඒ ඇතු විදුමටආ වැදි හට
පුදා මේ දළ දෙක දීලා දෝතට
එදා ඒ බුදු බව ලැබුණා මා හට
පුදා වඳිමු අපි මල් ගෙන දෝතට

51 රන් බඳ රැළි දිලිසෙයි - ඉණට කසී සළු අඳිතෙයි
රඟ දෙතේ - සබ තුළ කෝළ හැර යතේ
රන් රසු නාද දෙතේ - පා බැඳි කිංකිණි කඩ තෙයි
රංග හළු ලතේ - කන් කළු ගීත හඬ ලතේ

52 දුනුකේ වැටකේ මල් ලෙස සැදෙමින් පෙළටා
අඟනෝ සබ බැස රඟ දෙන කලටා
අහසේ සඳ සේ රන්තරූ පිරිවර සේ රූවටා
වයනෝ පදරූති රබාන යසටා

53 බංගලි වළලු ලතේ - කරවට රන්මාල ලතේ
බමරූ රඟ දෙතේ - පදයට කුකුද කුද ගතේ
කන් පෙති මුතු බඳිනේ - පවනට රන් තෝඩු ලතේ
මූකුළු හසලතේ කිටතක කුකුද කුද ගතේ

54 වරලස සිකිපිල් බඳනා - ගවසා මල් පෙති වට
හැඩකර සුදු සේලය අඳනා - දමමින් රැළි පොට
සොබමන් ලද ලිය වඩනා - ලීල සබාවට
රසකර කවි ගී පද ගයනා - වයන රබානට


බංකු රබාන


අත් රබාන


විරිදු රබාන


කරකවන රබාන

# ඔරුපාරු කවි

55 සූරිය උදාවෙන තුරු පිනි බැවිල්ල
පාරුව පදින තුරු ජලයේ සෙල විල්ල
මාරුව බල බලා හිතයට කැර කිල්ල
කාරිය කෙරෙන තුරු කාගෙත් රැවටිල්ල

56 අවරගිරේ ගිර අවරේ ගිර වුන්ට
අදින සැරේ රොන් ගෙනියන බඹ රුන්ට
ගති අවරේ ගිරිමුදුනේ රැ වෙන්ට
එනු මිතුරේ අපි සැම පාරුවෙ යන්ට

57 බෝඹු ඉදල දළු දාදෝ නොදාදෝ
කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ
කැලණි ගඟේ ඔරු යාදෝ නොයාදෝ
කලුගෙ නගා මට දේදෝ නොදේදෝ

58 බෝඹු ඉදල දලු ලන්නේ වැස්සකටයි
කෙකටිය මලේ වක යන්නේ වතුරකටයි
කැලණි ගඟේ ඔරු යන්නේ පදින කොටයි
කලුගෙ නගා මට දෙන්නේ නැකතකටයි

59 ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී වරෙන්

60 මාතර ගඟේ ඉන්නා කිඹුලිගෙ පැටියා
තල්ල සුදුයි බෙල්ලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතාගෙන සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගෙ පැටියා

61 ගමන් යන්ඩ නැකතින් පාරු පැද ගෙනේ
සමන් දෙවියන්ඩ පුද පඬුරු බැඳ ගෙනේ
මෙවන් කළු ගඟේ කඳු මුල් බලා ගෙනේ
අපිත් යමුව සැම දෙවියන්ට වැඳ ගෙනේ

## තල මල් කවි

62 සඳ විලසින් සඳ මඩල ලෙසින්
එම රැස් විලසින් මල් වට දිලෙනා
දඹ ගෙතුමෙන් මුතු පබලු පෙළින්
පෙළ කිනිති බරින් මල් වට දිලෙනා
නද කරමින් වීණාව නදින්
බිඟුරොන් ගනිමින් ගුවනේ තිබුනා
සොඳ රුවනින් තලමල මෙලෙසින්
සක්වල සතොසින් ඒ මල පිපුනා

## නෙළුම් කවි

63 ඔකද ලියේ අර උණ පඳුරේ යට උණ මල දෝ අර කරකැවෙනා ........කරකැවෙනා

ඔකද ලියේ අර සපු පඳුර යට සපු මල දෝ අර කරකැවෙනා ..........කරකැවෙනා

ඔකද ලියේඅර බට පඳුර යට බට මල දෝ අර කරකැවෙනා ..........කරකැවෙනා

ඔකද ලියේ අර මල් පඳුර යට මොන මල දෝ අර කරකැවෙනා ..........කරකැවෙනා